# සමනල අඩවිය හා ශ්‍රී පාදස්ථානයේ උරුම අගයන් හා කළමණාකරණ ක්‍රියාදාමය

එච්.ටී.සී.ඩී. හපුතන්ත්‍රී

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
chalanimahaputhantri@gmail.com

ප්‍රමුඛ පදඃ සිරිපා අඩවිය, ශ්‍රීපාදස්ථානය, උරුම කළමනාකරණය, සමන් දෙවියෝ, මධ්‍යය කඳුකර උස්භූමි

## හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති උරුම ස්ථානයන් හඳුනා ගැනීමේදී මධ්‍යය කඳුකර උස්බිම් කලාපය සුවිශේෂී තැනක් හිමිකර ගනු ලැබේ. 2010 වර්ෂයේදී යුනෙස්කෝ ලෝක උරුම අතරට එක් වූ උස්බිම් කඳුකර ප්‍රදේශයට අයත් ලෝක ව්‍යාප්තික මට්ටමෙන් අගයන් සහිත යැයි හඳුනා ගන්නා ලද ස්ථාන ත්‍රිත්ත්වයක් මෙහිදී හඳුනාගත හැකි ය. ඒ අතර නකල්ස් වන රක්ෂිතය, හෝර්ටන් තැන්න කලාපය සමග මෙහිදී වැඩි අවධානයක් යොමු කරනු ලබන ශ්‍රී පාද අඩවි භූමියයි. ශ්‍රීපාද අඩවියත් එහි වන ස්වාභාවික පාරිසරික වැදගත්කම, භූ රූපණයන්, හා එහි වන සංස්කෘතිකමය අගය වැඩි කරන ශ්‍රිපාද පත්මය හා බද්ධව පාරම්පරිකව ඉදිරියට පවත්වාගෙන එනු ලබන චාරිත්‍ර, සම්ප්‍රදායන් සංස්කෘතිකමය පසුබිම මෙන් ම පුරා විද්‍යාත්මක අගයන් නිරූපිත දැ වෙන් වෙන්ව හඳුනා ගනිමින් එකී සියලු උරුම සාධකයන් ආරක්ෂා කරලීම උදෙසා දැනට ගෙන ඇති මෙන් ම ඉදිරියට ගත යුතුව ඇති පියවරයන් පිළිබඳව මෙහිදී සාකච්ජා කළ යුතුව ඇත.

ශ්‍රි පාද අඩවිය හා ශ්‍රීපාද පත්මය සනිටුහන් කළ ස්ථානය ආශ්‍රිතව පවතින විශ්වීය වශයෙන් වැදගත් වන අගයන් රාශියකි. මෙහිදී මධ්‍යය කඳුකරය ලෝක උරුමයක් වීම උදෙසා බලපවත්වන ලද හේතු සාධක විමසීමේදී ලෝක උරුම නිර්ණායක අතර වන 9-10 යන වගන්ති වැදගත් වේ.ඒ අනුව

(9), ජීව විද්‍යාත්මක වශයෙන් පාරිසරික වශයෙන් වැදගත් යැයි සැලකිය හැකි පිරිසිඳු ජලය වෙරළ සහ සමුද්‍ර ආශ්‍රිත ස්ථාන මෙන් ම ශාක හා සත්ත්ව ප්‍රජාව සහිත ස්වභාවික පද්ධතියක් වීම.

(10). වඳවීමේ තර්ජනයට ලක් වී ඇති ජෛව විවිධත්වයෙන් අනූන සත්ත්ව ප්‍රජාවන් ජීවත් වන ස්ථානයක් වීම.

යන නිර්ණායකයන්ට යටත්ව ශ්‍රී පාද අඩවිය උරුමයක් ලෙස නාමකරණයට ලක්ව ඇති අතර එකී ස්වභාවික වශයෙන් හඳුනාගත හැකි ලක්ෂණ මෙන් ම අභයභූමියක් ලෙස 1940 ඔක්තෝබර් මස විසිපස් වැනි දින ප්‍රකාශයට පත් වීමත්, 2007 සැප්තැම්බර් මස විසි එක්වැනි දින ස්වාභාවික රක්ෂිතයක් ලෙස නම් කිරීමත් හේතුවෙන් මෙහි වැදගත්කම තීව්‍ර වී ඇත.විවිධ ජාතීන්ගේ ආගමික විශ්වාසයන් අනුව වන්දනීයත්වයට පාත්‍රව ඇති ස්ථානයක් ලෙස මෙම පරිශ්‍රයේ වන අප්‍රමාණ වූ අගයන්ගෙන් අගතැම්පත් අනන්‍යය ලක්ෂණ උද්වීපනය කොට දක්වාලිය හැකි වේ.

මෙහිදී ශ්‍රී පාද අඩවිය හා ශ්‍රීපාදස්ථානය ආශ්‍රිතව අතීත හා වර්තමාන උරුමය කළමණාකරණයේ පුරාණ ලක්‍ෂණ හා නව්‍යතා හඳුනා ගනිමින් ඒවා තුළ වන වැදගත් හරය ගොනු කොට පුරාණ අනන්‍යය සාධක පවතී නම් එම සාධක ද ආරක්‍ෂා කර ගනිමින් වැඩි දියුණු විය යුතු අංග හඳුනා ගනිමින් අර්ථ සම්පන්නභාවය තවදුරටත් ස්ථාවර කරලීමට අවශ්‍යය පියවර ගත යුතුව ඇත.

**ක්‍රමවේදය**

පූර්ව පර්යේෂණ අධ්‍යයන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට පුස්තකාල අධ්‍යයන හා ඡායාරූප, සිතියම් හා දළ සටහන් භාවිත කිරීම් හරහා වැඩිදුර පැහැදිළි කිරීම සහ සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව අධ්‍යයන පැවැත්වීම මගින් ශ්‍රී පාදස්ථානය ආශ්‍රිත කාර්යයේ නියුතු රාජ්‍යය, පෞද්ගලික ආයතනවලින් තොරතුරු සපයා ගැනීමත් ශ්‍රීපාද අඩවිය හා ශ්‍රීපාදස්ථානය ආශ්‍රිත පාර්ශයවකරුවන් හරහා ලබා ගන්නා තොරතුරු සමස්තයක් ලෙස ගෙන එක්කොට විශ්ලේෂණය කර පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කෙරේ.

**ප්‍රතිඵල හා සාකච්ජාව**

ශ්‍රී පාද අඩවිය හා ශ්‍රීපාදස්ථානය ආශ්‍රිතව පවතින ජනශ්‍රැති හා ජනප්‍රවාද ආශ්‍රය කර ගනිමින් විවිධ පර්යේෂණ දනට සිදුව පවතී. නමුදු එහි වන උරුමය හෝ උරුමය කළමනාකරණය කිරීම සබැඳිව පර්යේෂණ සිදු කිරීමට මැදිහත්වීම අවම මට්ටමක පවතී.එම මාතෘකාව අනුව යමින් උරුමය කලමනාකරණය කිරීමට, උරුමය ආශ්‍රිත අගයන් හඳුනා ගැනීමත් ඒ තුළින් භූ-ගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, පාරිසරික වටිනාකම, පුරා විද්‍යාත්මක වැදගත්කම යනාදී කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

මහවැලි, කැලණි, කළු, වළවේ යන ප්‍රධාන ගංගාවන්ගේ උපත සමනල අඩවිය ආශ්‍රිතව වීමත්, සත්ත්ව කොට්ඨාශ ගත් කළ ආවේණික පක්‍ෂීන්, මත්ස්‍යයින්, උරගයින්, උභය ජීවීන්, ක්‍ෂීරපායී ජීවීන් විශේෂ රැසක් ස්ථිර නිජබිම කරගත් මෙම පරිසර පද්ධතිය තුළ වඳවී යාමේ තර්ජනයට මුහුණ පා සිටින ජීවී විශේෂ සහ ශාක විශේෂ රැසකගේ ද ජීවය පවත්වාගෙන යාමට මෙම පරිසරය දායක වී ඇත. තෙන්නකෝන් ජයතිස්ස. (2013)

ශ්‍රී පාදස්ථානය හා සමනල අඩවිය ආශ්‍රිත ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම සාකච්ජා කිරීමේදී ඓතිහාසික වශයෙන් මෙම අඩවිය වැදගත් වීමෙහිලා ශ්‍රීපාද කන්ද හා බැඳී පවතින සිරිපතුල පිහිටුවීම, මෙන් ම අතීත රජ දරුවන්ගේ ආගමනයන් හා ශ්‍රීපාදස්ථානය වෙත සිදු කළ විවිධ පුද පූජාදිය මෙහිදී වැදගත්ය. එහිදී අනුරාධපුර සිට පොළොන්නරුව, දඹදෙණි යන යුගයන්හී විශේෂයෙන් තොරතුරු සඳහන් වේ. මහා විජයබාහු රජු, ශ්‍රී නිශ්ශංකමල්ල, දෙවන පරාක්‍රමබාහු රජු පිළිබඳව මෙහිලා සාහිත්‍යය හා පුරා විද්‍යාත්මක සාධක වේ. විදේශීයන්ගේ ආගමනයන් අතර ග්‍රීක ජාතික ඇලෙක්සැන්ඩර් හා බෝල්නාස් මන්ත්‍රකරුගේ පැමිණීම ග්‍රීක වාර්තා සඳහන් කරන අතර විවිධ දේශාටකයන් සිය වාර්තාවල ශ්‍රීපාද අඩවිය ඇතුළු මෙහි වන වැදගත්කම් දක්වා ඇත. පුරා විද්‍යාත්මක වශයෙන් ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට සාධක හමු වන අතර ශ්‍රීපාද අඩවිය ආශ්‍රිත හමුවන නිශ්ශංකමල්ල රජුගේ භගවාලෙන ලිපිය, මහා විජයබාහු රජුට අයත් අඹගමුව ශිලා ලේඛනය, රත්නපුර ආශ්‍රිතවද ශිලා ලිපි හමුවන අතර ශ්‍රීපාදස්ථානය ආශ්‍රිත පැරණි පරිපාලන කටයුතු සම්බන්ධ විවිධ ලේඛන හමුවී තිබේ.

ශ්‍රීපාද අඩවිය හා ශ්‍රීපාදස්ථානය ආශ්‍රිතව පවතින කළමනාකරණ කටයුතු හඳුනා ගැනීමේදී ප්‍රධාන වශයෙන් එය

- මාර්ග පද්ධතිය- මෙහිදී මාර්ග 7ක් හඳුනා ගත හැකි ය.
  හැටන්-මස්කෙලි නල්ලතන්නි මාර්ගය
  රත්නපුර-ගිලීමලේ පලාබත්තල මාර්ගය
  කුරුවිට-එරත්න කැකුණහින්න මාර්ගය
  දෙහෙනකන්ද-මුක්කුවත්ත මාර්ගය
  මරේවත්ත, රාජමලේ මාර්ගය
  දූරණියගල, මාලිම්බඩ මාර්ගය
  ගවරවිල මස්කෙලිය මාර්ගය හෙවත් ඌව මාර්ගය
  උක්ත කී මාර්ග අතුරෙන් හැටන් හා රත්නපුර හරහා වැටෙන මාර්ග පද්ධතිය වැඩි වශයෙන් භාවිත වන හෙයින් වැඩි අවධානයක් මෙම මාර්ග ද්විත්වය වෙත යොමුව ඇත.
- ආලෝකකරණ කටයුතු
  1930 කාලය තුළ සිට 1950 ස්ථිර වශයෙන් ම මෙම පූජා භූමියට විදුලිය සැපයීමත් සමග ශ්‍රීපාද අරමුදලෙන් ප්‍රතිපාදන යොදවමින් විදුලි කලමනාකරණ කටයුතු සිදු කෙරේ.
- කැලි කසල සහ අපද්‍රව්‍යය බැහැර කිරීමට ගෙන ඇති පියවර
  පාසැල්, සෞඛ්‍යදාන හා විවිධ ස්වෙච්ඡා සංවිධාන මෙන් ම වනජීවී කාර්යාල, විවිධ පරිසර සංවිධාන වල මැදිහත්වීම හඳුනා ගත හැකි ය.
- බැතිමතුන්ට සලසා ඇති පහසුකම්
  දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල, රජයේ ආයතන, පෞද්ගලික ආයතන මැදිහත් වීම හරහා මාර්ග පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, ආපනශාලා, හෝටල්, වෙළඳසැල්, රථගාල්, විවිධ පහසුකමු සලසා දී ඇත,
- ආරක්ෂණ වැඩසටහන් හා සැලසුම්
  ශ්‍රීපාද අඩවිය ආශ්‍රිත රක්ෂිත කලාපය ආරක්ෂාව උදෙසා ප්‍රධාන වශයෙන් නල්ලතන්නිය හා පලාබද්දල යන වනජීවී කාර්යාල හා අනුබද්ධිතව බීට්ටු කාර්යාල ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකා පොලීසිය ආරක්ෂක අංශ වාර අවාර දෙසමයන්හීදී ම මෙම උරුමය වෙනුවෙන් සේවය සලසා දෙනු ලැබේ.
- ශ්‍රීපාද උඩ මළුවේ කළමනාකාරිත්වය
  මේ යටතේ පිළිවෙලින් පරිපාලන කටයුතු කාණ්ඩ වශයෙන් බෙදා දක්වා,
  ශ්‍රී පාද නායක ස්වාමීන් වහන්සේ, භාරකාර තැන, ආගමික සේවා අධිකාරී, කළමනාකරු, ලිපිකරුවන්, කපුරාළවරු, තේවාකරුවන්, කැපකරුවෝ, ප්‍රත්‍ය සම්පාදකයෝ, කම්කරුවන් වශයෙන් කායයි මණ්ඩලය බෙදා ඇති අතර වාර්ෂික විශේෂ සේවාවන්හි නියුතු රාජ්‍ය අනුයුක්තව විදුලි සම්පාදක, ජල සම්පාදක, සෞඛ්‍යය සේවා, තැපැල් සේවා, පොලිස් ආරක්ෂක සේවා වැනි තනතුරු යටතේ උඩ මළුවේ ක්‍රියාකාරිත්වය හඳුනාගත හැකි ය.

උක්ත කී කරුණු වලට අදාළව සිරිපා අඩවිය ශ්‍රීපාදස්ථානය ආශ්‍රිත උරුමය හා එම උරුමය කවර ආකාරයකින් කළමනාකරණය සිදු වේදැයි කරුණු හඳුනාගත හැකි අතර උරුම අගයන් නිසි පරිදි හඳුනා ගනිමින් උරුමය කළමනාකරණය කිරීමට අවශ්‍යය පියවරයන් ගැනීම මෙය රැක ගැනීමෙහිලා අත්‍යාවශ්‍ය වන්නේය.

## ආශ්‍රිත ග්‍රන්ථ

තෙන්නකෝන්, ජයතිස්ස (2013) *සමනොළ සිරිපා වරුණ.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.